සියලුමහිමිකම්ඇවිරිනි / All Rights Reserved

# Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 11 – Second Term Test – January 2022

දෙවන වාර පරීක්ෂණය - 2022 ජනවාරි - 11 ශ්‍රේණිය

කාලය : පැය 1
Time :1hour

| 44 | S | I |
|---|---|---|

## Dancing – I
## නර්තනය – I

Name :- .................................................. Grade : -................ Index number:-....................

❖ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

1. මහා පරාක්‍රමබාහු රජතුමා ඉදිකළ "සරස්වතී මණ්ඩපය" තුළින් නර්තන කලාවට ලැබුණ රාජ්‍ය අනුග්‍රහය පැහැදිලි වන්නේ,
   (1) අනුරාධපුර යුගයේදී ය (2) මහනුවර යුගයේදී ය
   (3) පොළොන්නරු යුගයේදී ය (4) කෝට්ටේ යුගයේදී ය

2. පහතරට නැටුම් සම්ප්‍රදාය දියුණු කිරීමට මහත් කැපවීමෙන් කටයුතු කළ පුද්ගලයෙකි.
   (1) රද්දැල්ලේ පොඩි මහත්තයා (2) කේ.එස්. ප්‍රනාන්දු මහතා
   (3) එස්. පණිභාරත මහතා (4) එන්.ඒ. සිරිබෝහාමි මහතා

3. රිද්මයට ප්‍රධාන තැනක් දෙමින් වාචික ආභිනය භාවිතා නොකරන නාට්‍ය වර්ගය හඳුන්වන්නේ,
   (1) මුද්‍රා නාට්‍ය නමිනි (2) ශෛලීගත නාට්‍ය නමිනි
   (3) ගීත නාට්‍ය නමිනි (4) තාත්වික නාට්‍ය නමිනි

4. නොඇදෙන අකුරු නැතහොත් තනි අකුරු හඳුන්වන්නේ,
   (1) ලඝු අකුරු වශයෙනි (2) ගුරු අක්ෂර වශයෙනි
   (3) ප්ලූත අක්ෂර වශයෙනි (4) මාත්‍රා යනුවෙනි

5. රිද්මයානුකූල චලන සඳහා සුදුසු ගීතයකි
   (1) අක්කෙ අක්කෙ අර බලන්නකෝ.... (2) ඕලු පිපීලා විල ලෙල දෙනවා....
   (3) දෑතට වලලු මල්මුතු වැල්..... (4) මිහි මඩලේ අඳුරු කුසේ......

6. ඊළඟ භාවිතා කරන්නේ,
   (1) ගෙවල් අලංකරණයේදීය (2) යක් තොවිල් වලදී ය
   (3) මංගල උත්සවවලදීය (4) ආගමික උත්සව වලදී ය

7. මහා බඩා පෙරටු කරගෙන යනු ලබන ප්‍රධාන පෙරහැරකි.
   (1) දළදා පෙරහැර (2) දෙවුන්දර පෙරහැර
   (3) සමන් දේවාල පෙරහැර (4) වෙල් පෙරහැර

8. සංචාරී චලනයකි
   (1) ඉඳ ගැනීම (2) පිම්බීම (3) පෙරළීම (4) සිටගැනීම

සියලුමහිමිකම්ඇවිරිනි / *All Rights Reserved*

9. වල්ලතෝල් නාරායන මෙනන් විසින් රාම නාට්ටම්, ක්‍රිෂ්ණාට්ටම් ඇසුරු කොටගෙන නිර්මාණය කළ සාම්ප්‍රදායික නැටුම් ක්‍රමය වන්නේ,

(1) කථකලි නැටුම් ය (2) භරත නැටුම්ය
(3) කථක් නැටුම් ය (4) මණිපුර නැටුම් ය

10. හින්දු භක්තිය පදනම් කොටගත ඊසාන දිග භාරතයේ පවත්නා නර්තන සම්ප්‍රදාය වන්නේ,

(1) තාණ්ඩව බවින් යුත් කථක් නර්තනයයි
(2) ලාස්‍ය බවින් යුත් මණිපුරි නර්තනයයි
(3) ලාස්‍ය බවින් යුත් කථක් නර්තනයයි
(4) තාණ්ඩව බවින් යුත් මණිපුරි නර්තනයයි

11. වෙස් ඇඳුම් කට්ටලයේ මැණික් කටුව මත පළඳින ආභරණය හඳුන්වනු ලබන්නේ,

(1) උරබාහු නමිනි (2) බන්දි වළලු නමිනි
(3) කෙමෙත්ත නමිනි (4) බුබුළු පටිය නමිනි

12. වෙස් මුහුණ සාදා ගැනීමට වඩාත් යෝග්‍ය දැව වර්ගය වන්නේ,

(1) කිතුල් සහ රුක් අත්තන (2) වෙල් කදුරු සහ කොස් ය
(3) වෙල් කදුරු සහ රුක්අත්තන (4) කිතුල් සහ කොස් ය

13. මහනුවර යුගයේ ප්‍රශස්ති ගායනය කොට ඇතැයි සැලකෙන්නේ,

(1) මගුල් මඩුවේදී ය (2) හේවිසි මණ්ඩපයේදී ය
(3) කවිකාර මඩුවේදී ය (4) දළදා මළුවේදී ය

14. දෙතිතට අයත් වන්නම් දෙකකි.

(1) තුරඟා සහ සැවුලා (2) කිරලා සහ මයුරා
(3) තුරඟා සහ වෛරොඩි (4) කිරලා සහ ගජගා

### ❖ අංක 15 සිට 18 තෙක් ප්‍රශ්න සඳහා පහත තොරතුරු ඇසුරින් පිළිතුරු සපයන්න.

**නර්තන තරඟාවලියකින් සිසුන් සිව්දෙනෙකුගෙන් අසන ලද ප්‍රශ්න සහ ඔවුන් ඊට පිළිතුරු ලබා දුන් ආකාරය පහත දැක්වේ.**

ප්‍රශ්නය -

A දේශීය නර්තන සම්ප්‍රදායයන් අයත් ප්‍රධාන ශාන්තිකර්මයක පුද ලබන දෙවිවරුන් දෙදෙනකු නම් කරන්න.

B පහතරට වන්නමක් ඉරට්ටියකින් අවසාන වන්නේ නම් උඩරට/සබරගමු වන්නම් අවසන් කරන්නේ කුමන කොටසකින් ද?

C ”රන්දද” මුද්‍රා නාට්‍යය නිර්මාණය කළ ශිල්පියා කවුද?

D චිත්‍රසේන මහතා විසින් නිර්මාණය කළ මුද්‍රා නාට්‍ය දෙකක් නම් කරන්න.

එක් පිළිතුරකට ලකුණු 5කි.

| නම | | | | |
|---|---|---|---|---|
| කුමාරි | වීරමුණ්ඩ/කොසඹා | අඩව්ව | ඒ.ඉඹුල්ගොඩ | කරදිය/ශිවරංග |
| මදුමි | පත්තිනි/සමන් | අඩව්ව | එස්.පණිභාරත | විදුර/රාවණ |
| නිලන්ති | දෙවොල්/පත්තිනි | කස්තිරම | ඒ.ඉඹුල්ගොඩ | නල දමයන්ති/රාවණ |
| සම්පත් | වලියකුන්/ගණ | අඩව්ව | ඒ.ඉඹුල්ගොඩ | මිණි සලඹ/බතේ උපත |

සියලුමහිමිකම්ඇවිරිනි / All Rights Reserved

15. මෙම තරඟයේදී ලකුණු වැඩි ප්‍රමාණයක් ලබාගෙන ඇත්තේ කවුද?
(1) කුමාරි (2) මදුමි (3) නිලන්ති (4) සම්පත්

16. මදුමිගේ වැරදි පිළිතුරු සංඛ්‍යාව කොපමණද?
(1) 2 (2) 3 (3) 4 (4) 5

17. සම්පත්ගේ නිවැරදි පිළිතුරු සංඛ්‍යාව කොපමණද?
(1) 4 (2) 3 (3) 4 (4) 5

18. නිලන්ති ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇත්තේ කවර සම්ප්‍රදායක් පදනම් කරගෙන් ද?
(1) පහතරට (2) උඩරට (3) භරත (4) ගැමි නැටුම්

19. බලි ශාන්ති කර්මය හා බැඳි ග්‍රහයින් වේ.
(1) ඉරු, සිකුරු, විෂ්ණු (2) ඉරු, සිකුරු,බ්‍රහ්ම
(3) සඳු, කෙහෙතු, අනංග (4) සඳු, කෙහෙතු, සෙනසුරු

20. ආචාර්ය පණිභාරත ශූරීන් විසින් නිර්මාණය කරන ලද නර්තන අංග වේ.
(1) පන් නෙලීම, සුරඹාවල්ලිය (2) ගොයම් කැපීම, නාරිලතා
(3) පන්නෙලීම, ගිරිදේවි (4) ගොයම් කැපීම, ගිරිදේවි

21. උඩරට වෙස් ඇඳුම් කට්ටලයේ ඇති ආභරණ කිහිපයකි.
(1) උල්උඩය, දෙවල්ල, රතු කුට්ටම් (2) සිඛා බන්ධනය, තෝඩුපන්, පායිම්පන්
(3) සිඹා බන්ධනය, හඟල, රතු රෙද්ද (4) උල්උඩය, හඟල, හැඩකැල්ල

22. උඩරට නර්තනයේදී පමණක් භාවිතා වන වචන වන්නේ,
(1) ආවැන්දුම, කොල්පාඩුව, කොතලපදය
(2) ආවැන්දුම, දෙවොල්පාඩුව, අඩව්ව
(3) යක් ඇනුම, දුනුලප්පුව, මඩු පේ කිරීම
(4) කුවේණි අස්න, දුනුමාලප්පුව, කොහොඹා හැල්ල

23. නර්තනයක රසඥතාවය සඳහා වඩා වැදගත් වන්නේ කුමන නර්තන ඇසුරු කිරීමද?
(1) දේශීය නර්තනය
(2) උසස් ගණයේ නර්තන
(3) ප්‍රාසාංගික නර්තන
(4) අනුකරණාත්මක නර්තන

24. දෝංජිං ජිං තකට දෙංතක මෙය,
(1) මාත්‍රා 3 4 දෙතිතට අයත් බෙර පදයකි
(2) මාත්‍රා 2 4 දෙතිතට අයත් බෙර පදයකි
(3) මාත්‍රා 2 3 දෙතිතට අයත් බෙර පදයකි
(4) මාත්‍රා 4 4 දෙතිතට අයත් බෙර පදයකි

සියලුමහිමිකම්ඇවිරිනි / *All Rights Reserved*

25. කොහොඹා කංකාරියේ හත් පදයට අයත් වන්නේ,
(1) මල් පදය, මල් හත් පදය, සලු පදය
(2) මල් පදය, කොතල පදය, අගුරු දුම්මල පදය
(3) බුලත් පදය, කොතල පදය,සළු පදය
(4) බුලත් පදය, කොතල පදය, මල්හත් පදය

26. සත් වෙත් මහත් අදර ලත් යුත් සිදත් කුමරු.... මෙහි ඉතිරි කවි පදය,
(1) ගත් සිත් නොසත් පැවදි අංගා
(2) යන්නෙන් නොසිත් තිදෙන සමඟා
(3) ගං තෙරට පන් වුණිය සමඟා
(4) ගෙන එදින අසුගපෙිට නැංගා

27. මාත්‍රා 2 + 2 + 2 + 4 තාල රූපයට තාලම්පට වාදනය කෙරෙන්නේ,
(1) තිත් තෙයි තිත් තෙයි (2) තිත් තෙයි තෙයි තෙයි
(3) තිත් තිත් තෙයි තෙයි (4) තිත් තිත් තිත් තෙයි

28. නර්තන කලාවට අධිපති දෙවියා වන්නේ,
(1) නටරාජා (2) ගණපති (3) සරස්වතී (4) කෘෂ්ණා

29. ආමද්, පරන්, ගත් යන නර්තන අංග ඇතුළත් නර්තන සම්ප්‍රදාය වන්නේ,
(1) කථක් ය (2) භරතය (3) කථකලිය (4) මණිපුරිය

30. රාස්ලීලා නර්තනය අයත් වන ඉන්දියානු නර්තන සම්ප්‍රදාය,
(1) කථක් (2) මණිපුරි (3) කථකලි (4) භරත

31. 
මෙම රූපය දැක්වෙන්නේ,
(1) රට යකුවේ නානුමුරයයි
(2) රට යකුමේ වඩිග පටුනයි
(3) සූනියම් වඩිග පටුනයි
(4) සන්නි යකුමේ වඩිගපටුනයි

32. බෙර ඇසට කිතුල් කතක් යොදා සකස් කර ගන්නා වාද්‍ය භාණ්ඩය වන්නේ,
(1) රබාන (2) උඩැක්කිය (3) බුම්මැඩිය (4) දඬුබෙරය

33. "ලකල පුළුලුකුල බැදි මිණි මෙවුල්ලා" මෙම කවිය ඇතුළත් සංදේශ කාව්‍ය වන්නේ,
(1) සැලලිහිණි (2) පරෙවි (3) ගිරා (4) මයුර

34. ශ්‍රී ලංකාවේ මුද්‍රා නාට්‍ය කලාවේ ස්වර්ණමය යුගය වශයෙන් සැලකේනේ,
(1) 1930-1940 දශකය (2) 1940-1950 දශකය
(3) 1950-1960 දශකය (4) 1935-1945 දශකය

35. වලියකුන් හා මෙලෙයි යකුන් පුද ලබන ශාන්ති කර්මය නම්,
(1) බලි යාගය (2) වලියකුම් යාගය
(3) කඩවර කංකාරිය (4) කොහොඹා කංකාරිය

සියලුමහිමිකම්ඇවිරිනි / *All Rights Reserved*

36. ලී දෑතට ගෙන කනුවක් වටා රටා මවමින් හටන ද්‍රවිඩ ගැමි නැටුමකි.

(1) කෝලාට්ටම් (2) කාවඩි

(3) පින්නල් (4) කෝලාට්ටම්

37. ශෝක නම් ස්ථායී භාවය උපදින රසය

(1) ශෘංගාර රසය (2) කරුණා රසය

(3) වීර රසය (4) හාස්‍ය රසය

38. හණ නූලෙන් පවන් සැලීමට යොදා ගත් රාජ සබා මෙවලමකි.

(1) ආවාහ (2) සේසත (3) චාමර (4) සේලය

39. නර්තනයේ අවකාශය හා රිද්මය මෙන් චිත්‍ර කලාවේ දී අවශ්‍ය වන්නේ,

(1) වර්ණ හා හැඩතල (2) වර්ණ හා දිශාව

(3) දිශාව හා හැඩතල (4) රේඛාව හා දිශාව

40. සොකරි ගැමි නාටකයේ රංගභූමිය හැඳින්වෙනුයේ,

(1) කරලිය නමිනි

(2) සඹය නමිනි

(3) කමත නමිනි

(4) තානායම්පල නමිනි

(ලකුණු 1 x 40 = 40)

සියලුමහිමිකම්ඇවිරිනි / All Rights Reserved

# Royal College - Colombo 07
රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 11 – Second Term Test – January 2022
දෙවන වාර පරීක්ෂණය - 2022 ජනවාරි - 11 ශ්‍රේණිය

කාලය : පැය 2
Time :2 hours

## Dancing – I
නර්තනය – I

| 44 | S | I |
|---|---|---|

Name :- ................................................... Grade : -................ Index number:-....................

❖ පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර, තවත් ප්‍රශ්න 4 ක් සඳහා පිළිතුරු සපයන්න.

01. (i) සියළුම ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු ඔබගේ පිළ

තුරු පත්‍රයේ අදාල අංක යොදා ලියන්න.

.............................. කවි ගද්‍ය හා පද්‍ය කොටස්වලින් යුක්ත ගායනා විශේෂයකි.

(ii) විලම්භ, මධ්‍ය .............................. වශයෙන් ලය කොටස් තුනකි.

(iii) .............................. නර්තන සම්ප්‍රදායේ විචිත්‍රවත් ඇඳුම් පැළඳුම් දක්නට ලැබේ.

(iv) "උඩරට නර්තන කලාව" ග්‍රන්ථය රචනා කරන ලද්දේ .............................. මහතාය.

(v) කථකලි නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ගායකයා .............................. නමින් ද අනු ගායකයා .............................. ද හඳුන්වයි.

(vi) කෝලම් රඟමඩල .............................. නමින් හඳුන්වයි.

(vii) වේදිකා සැරසිලි ආලෝකකරණය .............................. අභිනයට අයත් වේ.

(viii) පරාක්‍රමබාහු රජු විසින් සෙබළුන්ගේ ආශිර්වාදය පිණිස නැටුම් ගැයුම් වැයුම් පැවැත්වූ බව .............................. සඳහන් වේ.

(ix) "සොබවන් දෙව්වරු සදෙනෙක් එතනට" මෙය .............................. කවියකි.

(x) උඩරට වන්නම් මහනුවර .............................. මඩුවේදී හා පහතරට සින්දු වන්නම් දෙවුන්දර .............................. දේවාලයේ රචනා කළ බව සඳහන් වේ.

02. දේශීය නර්තන සම්ප්‍රදායන් අතුරෙන් එක් සම්ප්‍රදායක් අයත් ශාන්ති කර්මයක් ගෙන පහත සඳහන් කරුණු ඇසුරෙන් සාකච්ඡා කරන්න.

(i) එක් ශාන්තිකර්මයක් නම් කොට එම සාම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශ 4 ලියා දක්වන්න (ල.2)

(ii) එම ශාන්තිකර්මයේ මූලාරම්භය හා එය පසු කාලයේ පැවැත්වීමට හේතු මොනවා ද?(ල.4)

(iii) එහි දක්නට ලැබෙන චාරිත්‍ර විධි දෙකක් විස්තර කරන්න. (ල.6)

03. ප්‍රස්තාර කරන්න.

(i) මාත්‍රා 2 +4 දෙතිතට අයත් බෙර පදයක් ප්‍රස්තාර කරන්න. (ල.2)

(ii) මාත්‍රා 3 තනි තිතට අයත් රබන් පදයක් ප්‍රස්තාර කරන්න. (ල.4)

(iii) සිංහරාජ වන්නමට අයත් කවියක් හා කස්තිරම ප්‍රස්තාර කරන්න. (ල.6)

සියලුමහිමිකම්ඇවිරිනි / *All Rights Reserved*

04. (i) දඹදෙණි යුගයේ නර්තන කලාව පිළිබඳ තොරතුරු ලබාගත හැකි සාහිත්‍ය කෘති දෙකක් නම් කරන්න. (ල.2)

(ii) කෝට්ටේ යුගයේ ලියවුණු සංදේශ කාව්‍ය මඟින් එකල නර්තන කලාවේ තොරතුරු දැනගත හැකිය. ඉන් සාධක දෙකක් ඉදිරිපත් කරන්න. (ල.4)

(iii) නව නර්තන ප්‍රවණතා හමුවේ අධ්‍යාපන හා සමාජීය වශයෙන් නර්තන කලාවේ පිබිදීම පිළිබඳව කරුණු දෙකක් ඇසුරින් සාකච්ඡා කරන්න. (ල.6)

05. භාරතයේ ප්‍රචලිත ප්‍රධාන නර්තන සම්ප්‍රදායන්ට අයත් නර්තනාංග සහ වාද්‍ය භාණ්ඩ කිහිපයක් පහත දැක්වේ. (ජතීස්වරම්, තෝඩායම්, පුං, තබ්ලා)

(i) ඉහත දැක්වෙන නාමයන් හා බැඳි නර්තන සම්ප්‍රදායන් හතර වෙන් කොට පිළිවෙලින් ලියන්න. (ල.2)

(ii) ඉහත දැක්වෙන නාම ඇසුරෙන් එකක් තෝරා ගෙන ඒ පිළිබඳ කරුණු හතරක් ඉදිරිපත් කරන්න. (ල.4)

(iii) ඔබ කැමති භාරතීය අවනද්ධ භාණ්ඩයක රූප සටහනක් ඇඳ ඒ පිළිබඳව විග්‍රහයක් කරන්න. (ල.6)

06. පහත සඳහන් මාතෘකා තුනක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) සිරස් පාද කවි

(ii) උඩැක්කිය හා රබාන

(iii) මණ්ඩිය

(iv) ත්‍රිවිධ ලය

(v) ද්‍රවිඩ ගැමි නැටුම්

07. ජන නැටුම් හා ජන නාටක ජීවිතය විදහා දක්වන කලාංග වේ.

(i) මෝල්ගස් හෝ කඩු හෝ රබන් කවියක් ලියන්න. (ල.2)

(ii) සොකරි නාටකය පැවැත්වීමේ අරමුණු කෙටියෙන් විස්තර කරන්න. (ල.4)

(iii) ජස සහ ලෙන්චිනා කෝලම ඇසුරෙන් ජන ජීවිතය විවරණය වන ආකාරය විමසුමට ලක් කරන්න. (ල.6)